# චිත්‍ර කලාව

## විෂය නිර්දේශය

10 වන ශ්‍රේණිය

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

ශ්‍රී ලංකා

2007

# හැඳින්වීම

සුසමාහිත පෞරුෂ වර්ධනයක් ගොඩනැගීමෙහිලා උපකාරී වන සෞන්දර්ය ක්ෂේත්‍රයන් අතරින් චිත්‍රකලා විෂයට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි.

2007 නව විෂය නිර්දේශය සැලසුම් කිරීමේදී, පාසල් සිසු දරුවාගේ දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය කරලීම සඳහා ප්‍රධාන නිපුණතා හතක් පාදක කර ගැනේ. වින්දන ශක්ති වර්ධනය, නිර්මාණ කුසලතා පෝෂණය, විචාර බුද්ධි වර්ධනය මෙන්ම, ඉවසීම, සංයමය, චිත්තවේග පාලනය, සහයෝගිතාව වැනි අධ්‍යාත්මික ගුණවගාවන් වර්ධනය කිරීමේ අපේක්ෂණයන් විෂය අන්තර්ගතය සඳහා අනුගත කොට ඇත.

චිත්‍රකලා රසාස්වාදය, සංස්කෘතික පසුබිම, සිද්ධාන්ත, ප්‍රායෝගිකරණය හා නිර්මාණ කුසලතා වර්ධනය ආශ්‍රිත විෂය පරාසයකින් සමන්විත සෞන්දර්ය ක්‍රියාකාරකම් සමූහයකින් ආවරණය වී ඇති මෙම විෂය නිර්දේශය අධ්‍යයනයෙන් ස්වභාවික ව හා නිර්මිත ව උදාවිය හැකි අනාගත අභියෝග සඳහා මුහුණදීමට සමත් වූ නූතන වැඩ ලෝකයේ ජීවන කුසලතා සඳහා යෝග්‍ය සමබර පෞරුෂයකින් හෙබි දරු පරපුරක් බිහිකරලීම අපේක්ෂා කෙරේ.

ශිෂ්‍ය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාදාමය සාර්ථක කරගැනීමේ දී ගුරු කාර්ය භාරය, පහසුකම් සැලසීමේ හා උපකාරක සේවාවක් ලෙස ශිෂ්‍ය කේන්ද්‍රිය ව ක්‍රියාත්මක වන අතර පුද්ගල අනන්‍යතාවයකින් යුත් ශිෂ්‍ය චර්යාමය නිපුණතා අදාළ නිර්ණායක් ඔස්සේ නිරතුරු අධීක්ෂණයට ලක්කිරීම ගුරුවරයාගේ විධිමත් තක්සේරුකරණය හා ඇගයීම් ක්‍රියාදාමය වඩාත් පහසු කරවීම පිණිස පාදක වනු ඇත.

ද්විතියික පාසල් අවධියට පත්වන හය ශ්‍රේණිය චිත්‍රකලා විෂය ධාරාව උගන්නා සිසුන්ගේ උසස් ඉගෙනුම් අවස්ථා සඳහා ප්‍රගුණ කළ යුතු නිපුණතා මට්ටම්, නියමිත විෂය පරාසයට අනුකූල ව මෙම විෂය නිර්දේශය තුළ අන්තර්ගත කොට ඇත. අදාළ විෂය කොටස් සඳහා ක්‍රියාකාරකම් සංවිධානය කර ගැනීමේදී චිත්‍රකලා ගුරුවරයාට ස්වාධීන අවකාශයක් ලබා දේ.

ගවේෂණ ශක්‍යතා තුළින් පෝෂණය වන විෂයානුබද්ධ ප්‍රායෝගික කුසලතා, සිසුන් සමාජගතවීමේ දී ඵලදායිවන අයුරින් ව්‍යවහාරික ජීවිතය හා බැඳි නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා යොමුකරවීමේ හා අන්තර්ජාතික දෘශ්‍ය නිර්මාණ දායකත්වයන් සඳහා සංවර්ධනය කරවීමේ ක්‍රමවේදයන්ට අයත් පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් මාලාවක් හඳුන්වා දී ඇත.

යහපත් චර්යාවන්ගෙන් හෙබි පූර්ණ සමාජානුයෝගයක් ලැබූ අනාගත ලෝකයට ඵලදායි හා නිර්මාණශීලී පුරවැසියකු බිහිකරලීමේ අපේක්ෂණයෙන් යුතු ව අදාළ ශිෂ්‍ය නිපුණතා සාක්ෂාත් කරගැනීම සඳහා මෙම චිත්‍රකලා විෂය නිර්දේශය හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රය පරිහරණය කිරීම ගුරුවරයාට මහත් පිටිවහලක් වනු ඇත.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# 10 ශ්‍රේණිය

## චිත්‍ර කලාව මූලික නිපුණතා

01. පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.

02. පරිසරයේ පවත්නා ද්‍රව්‍ය සම්පිණ්ඩනාත්මක ව චිත්‍රණය කරයි.

03 පාරිභාරික අවශ්‍යතා සඳහා යෝග්‍ය සැලසුම් හා සැරසිලි නිර්මාණ කරයි.

04. නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය කරයි.

05. විවිධ මාධ්‍ය භාවිතයෙන් මූර්ති හා කැටයම් නිර්මාණය කරයි.

06. ආගමික හා සංස්කෘතික අංග,දෙස් විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජන මාධ්‍යය ඇසුරින් හඳුනාගත් කලා අංග පිළිබඳ අධ්‍යයනය කරයි.

07. දේශීය හා විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති හා ගෘහ නිර්මාණ කලාවන්ගේ ගුණාත්මකතාවයන් විමර්ශනය කර ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# 10 ශ්‍රේණිය

## චිත්‍ර කලාව - නිපුණතා මට්ටම්

1.1 මිනිසා, සතුන්, පරිසරය, සම්බන්ධ වූ පෘථුල තේමා යටතේ මනා සංරචනයකින් යුතු චිත්‍ර නිර්මාණය කරයි.

1.2 දේශීය සාම්ප්‍රදායික චිත්‍රවල දක්නට ලැබෙන මිනිස් රූප, සත්ව රූප, ශාක හා මල් අධ්‍යයනය කරයි.

2.1 ස්වභාවික හා නිර්මිත වස්තූන් සම්පිණ්ඩනය කර ස්වභාවික ලක්ෂණ මතුවන සේ ඇද වර්ණ ගන්වයි.

3.1 පාරිභාරික භාණ්ඩ සඳහා නිර්මාණාත්මක සැලසුම් ඇද සැරසිලි කරයි

3.2 ළමුන් භාවිතා කරන භාණ්ඩ හා රෙදිපිළි සඳහා සැලසුම් හා සැරසිලි නිර්මාණය කරයි.

4.1 සන්නිදර්ශන චිත්‍ර නිර්මාණය කරයි.

5.1 විවිධ හැඩතල උපයෝගිකර ගනිමින් උන්නත කැටයම් නිර්මාණය කරයි.

6.1 තෝරාගත් දේශීය හා විදේශීය ශිල්පීන්ගේ කලා කෘති අගයයි.

6.2 ජනමාධ්‍ය ආශ්‍රිත විවිධ නිර්මාණාත්මක කලා අංග අගයයි.

7.1 මහනුවර සහ ගම්පල යුගවල ගෘහ නිර්මාණ , චිත්‍ර හා මූර්ති කලාව පිළිබඳ අවබෝධය ලබයි.

7.2 මිසර හා ග්‍රීක කලාවන් පිළිබඳ අවබෝධය ලබයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## චිත්‍රකලාව විෂයෙහි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපායන්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී මූලික වශයෙන් සිසුන් ගවේෂනයට යොමු කිරීම අපේක්ෂාකෙරේ. දැනුම පිළිබඳ ව ආකල්ප ගවේෂණයට වඩා යුගල හෝ කුඩා කණ්ඩායම් වශයෙන්මෙම කාර්යයේ සිසුන් යෙදවීම වඩා අර්ථවත් වේ. ශිෂ්‍යයාගේ සමාජ හැකියාවන් වර්ධනයකිරීම සඳහා මෙම ක්‍රමය උපයෝගි වේ.

චිත්‍ර කලාව විෂය නිර්දේශයේ ප්‍රායෝගික විෂය ක්ෂේත්‍රයේ ශිල්පීය දක්ෂතා වර්ධනය නිපුණතාවන් තුළින් සුවිශේෂ වූ ශිල්පීය ක්‍රම පිළිබඳ ප්‍රායෝගික අවබෝධය පුළුල් කරගැනීමහා ඒවා පරිහරණය කරන ක්‍රමවේද හඳුනාගැනීම සඳහා යොමු කළ යුතු වේ. චිත්‍ර සංරචනය, ද්‍රව්‍ය සම්පිණ්ඩනය ග්‍රැෆික් චිත්‍ර, මෝස්තර සැලසුම් ආදි අභ්‍යාස වෙනුවෙන් සිසුන් යොමු කළ යුතු ය. එමෙන්ම මෙම විෂයට සුවිශේෂ වූ පාරිභාෂික වචනාර්ථ පිළිබඳ පුළුල් අවබෝධයක් ලබාදීම චිත්‍ර කලාවට අදාළ සුවිශේෂ වූ සිද්ධාන්ත පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම විවිධ උපකරණ හා හැසිරවීම් පිළිබඳ ව අවබෝධය වර්ධනය ඇති කිරීම සඳහා සිසුන් යොමු කළ යුතු වේ.

මෙම අවබෝධයන් සඳහා වූ ප්‍රායෝගික අභ්‍යාසවල යෙදවීමෙන් පර්යාවලෝකය පරිමාණ, ත්‍රිමාණ ලක්ෂණ, ක්ෂය වෘද්ධි ලක්ෂණ වැනි සිද්ධාන්ත පිළිබිඹු වන මාතෘකාවලට අයත් චිත්‍ර සංරචනයන් සඳහා යොමු කිරීම, වර්ණ හා බැඳි මූලධර්ම අවබෝධ වන ආකාරයේ වර්ණ අභ්‍යාසවල යෙදවීම. විවිධ සාම්ප්‍රදායික බිත්තු සිතුවම් නිර්මාණ තුලින් පාරම්පරික චිත්‍ර සිද්ධාන්ත පිළිබඳ දැනුම වර්ධනය කිරීම පෝස්ටර් චිත්‍ර වෙළඳ දැන්වීම් , දවටන විවිධ මෝස්ත්‍ර නිර්මාණයන්ට යොමු කිරීමෙන් ග්‍රැෆික් හා මෝස්තර පිළිබඳ මූලධර්ම අවබෝධය සඳහා අවස්ථා සලසාදීම, මිනිස් රූප හා සත්ව රූප පරිමාණකූලව සෑදීමේ අවබෝධය සඳහා විවිධ මානව රූප ඉරියව් අධ්‍යයනයන් වෙනුවෙන් සිසුන් යොමු කිරීම සිදුකළ යුතු ය. එමෙන් ම චිත්‍ර කලාව විෂය නිර්දේශය තුළින් දේශීය හා විදේශීය චිත්‍රකලා ඉතිහාසය පිළිබඳ කරුණු න්‍යායාත්මක විෂය දැනුම ශිෂ්‍යයින් තුළ වර්ධනය කිරීමට යොමු කළ යුතු ය. චිත්‍ර කලාවේ ආරම්භය, විකාශනය, විවිධ චිත්‍රකලා යුග, වඅවිධ කලා කෘති හා ඒවායේ කලාත්මක හා ඓතිහාසික වටිනාකම් ඒවාට බලපෑ විවිධ ආගමික හා විදේශීය බලපෑම් හා ඒ පිළිබඳ රසාස්වාදයෙහි සඳහා සිසුන් යොමු කිරීම වැදගත් වේ.

චිත්‍ර කලාව ඉගැන්වීමේ ක්‍රමශිල්ප ක්‍රියාත්මක කිරීමේදී ශිෂ්‍යයන්ගේ ශාරීරික හා මානුෂික වර්ධනය පිළිබඳ ව ගුරුවරයා සැළකිලිමත් විය යුතු ය. විශේෂයෙන් ම ළමා චිත්‍රකලා සංවර්ධනය යුග පිළිබඳ ගුරුවරයා තුළ මනා වැටහීමක් තිබිය යුතු ය. ඒ අනුව ලබාදෙන චිත්‍ර මාතෘකා සහ ඉගැන්වීමේ ක්‍රම ශිල්ප ද වෙනස් විය යුතු ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

චිත්‍ර කලා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදයට යෝජිත ක්‍රම ශිල්ප රාශියක් ඇතුළත් කළ හැකි වේ. ප්‍රවේශය සඳහා,

- බුද්ධි කලම්භන
- සංවාද
- රූපවාහිනී දර්ශන හා අදාළ වීඩියෝ පට
- දෘශ්‍යාධාර ඇසුරෙන්

ගවේෂණය සඳහා චිත්‍රකලාව ඉගැන්වීම් ක්‍රම

- කණ්ඩායම් ක්‍රමය
- ගැටළු ක්‍රමය
- අනාවරණ ඉගෙනුම් ක්‍රමය
- තොරතුරු අධ්‍යයනය
- ක්ෂේත්‍ර චාරිකා
- චිත්‍ර ප්‍රදර්ශන සංවිධානය
- පැවරුම්
- ව්‍යාපෘති

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# ගුණාත්මක යෙදවුම් - චිත්‍ර කලාව (6 - 11 ශ්‍රේණි)

1. කඩදාසි වර්ග :

- ඇඳීමේ කඩදාසි සුදු
- බ්‍රිස්ටල් බෝඩ් - (Mat) - සුදු
- වාර්නිෂ් කොළ - විවිධ වර්ණ
- තෙල් කඩදාසි (Tracing Paper)
- ලියන කඩදාසි (Half Sheet)
- වර්ණවත් සඟරා /පුවත්පත් පිටු

2. සායම් වර්ග/මාධ්‍යයන් :

- පැස්ටල්
- දිය සායම් (ටියුබ්)
- පෝස්ටර් සායම්
- ඉමල්ෂන් පේන්ට්
- ඇක්‍රිලික් සායම්
- මුද්‍රණ තීන්ත

3. පින්සල් සහ ඇඳිමේ වෙනත් උපකරණ

- සේබල් හෙයා පින්සල් නො: 03,04, 05,06 හොග් හෙයා පින්සල් නො: 0, 02,06,12.
- ප්ලැටිග්නම් කූරු
- පැන්සල් 2B, 4B,6B.
- අඬිරූල්
- මීටර් කෝදු
- චිත්‍ර බංකු (Donkey Chairs)
- චිත්‍ර පුවරු (Drawing boards)
- ටීරූල්ස් (T Rules)
- වර්ණ ඵලක ( Colour Pallets)
- ඇමුණුම් කටු හා ක්ලිප්ස්
- චිත්‍ර පුවරු රඳවනයක් (Easels)
- ඵලක පිහි (පැලට් නයිෆ්/ Pallet Knifes)
- අමුරෙදි (ඝන, තුනී)
- කවකටු විහිත චතුරශ්‍ර කට්ටල (ලොකු සහ කුඩා)

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

4. බලා ඇඳිමේ උපකරණ

- ප්ලාස්ටික් බෝල
- කුඩා මැටි කල
- ගුරු ලේන්තු
- ප්ලාස්ටික් බාල්දි
- ඝනක සහ ඝනකාභ හැඩ
- විදුරු බෝතල

5. නව තාක්ෂණික සහ සරල තාක්ෂණික උපකරණ :

- උපරි ශීර්ෂ ප්‍රක්ෂේපන (O.H.P)
- විනිවිදක පත්‍ර (Transparent sheets)
- කදා ප්‍රක්ෂේපන (Slide Projectors)
- කදා (Slides)
- ග්‍රැෆික් රෝලර්ස්
- විදුරු තහඩු (Graphic Boards)
- කම්බි නැවීම සඳහා වන අඬු
- කටර් අඬු
- කුඩා මිටි
- කියත්
- මේසන් හැඳි - කුඩා (අඟල් 2 , 4)
- කුඩා සකපෝරු (විශ්කම්භය 10)
- කඩදාසි කපන පිහි
- වීඩියෝ යන්ත්‍ර

6. වෙනත් උපකරණ හා ද්‍රව්‍ය

- බයින්ඩර් ගම්
- පදම් කළ මැටි
- ප්ලාස්ටර් ඔෆ් පැරිස්
- සබන් කැට
- රෙජිෆෝම් ෂීට්ස් - (අඟල් 1)
- සිමෙන්ති
- කම්බි
- ඇඹිමේ උපකරණ (Modeling tools)
- ලෑලි කැබලි

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

7. දෙස් විදෙස් කලාකෘති :

- මුද්‍රිත ඡායාරූප
- වීඩියෝ පට
- කදා
- උපරි ශිර්ෂ ප්‍රක්ෂේපන සඳහා අවශ්‍ය පින්තූර සහිත විනිවිද පත්‍ර

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## ඉගෙනුම් ප්‍රවර්ධනය සඳහා පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

- ප්‍රදර්ශන
    - ජාතික මට්ටමේ ප්‍රදර්ශන සඳහා නිර්මාණ දායකත්වය
    - අනෙකුත් සෞන්දර්ය විෂයයන්ගේ වැඩසටහන්වලට සමගාමී ව ප්‍රදර්ශන පැවැත්වීම.
    - පන්ති කාමර ප්‍රදර්ශන පැවැත්වීම.
- තරග
    - නිවාසාන්තර ප්‍රාදේශීය හා ජාතික මට්ටමේ තරග සඳහා සහභාගිත්වය
    - ජාත්‍යන්තර තරග සඳහා සහභාගිත්වය
- චාරිකා
    - කලාත්මක වටිනාකමක් ඇති ඓතිහාසික ස්ථාන නැරඹීම සඳහා චාරිකා සංවිධානය
    - ගවේශන චාරිකා සංවිධානය
- වෙනත්
    - අධ්‍යතන ශිල්පීන්ගේ ප්‍රදර්ශන නැරඹීම
    - විෂයට අදාළ වැඩමුළු සඳහා සහභාගිවීම.
    - පන්තිකාමරය හා අවට අලංකාර කිරීමේ කුඩා ව්‍යාපෘති
    - පාසල් වත්ත අලංකාර කිරීමේ ව්‍යාපෘති
    - පාසලේ උත්සව අවස්ථා සඳහා නිර්මාණ දායකත්වය

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# <u>තක්සේරුකරණය හා ඇගයීම</u>

10 වන ශ්‍රේණියේදී චිත්‍ර කලාව විෂය තක්සේරුකරණය හා ඇගයීම සිදුවන්නේ පංතිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් සිදුවන අවස්ථාව තුළදීමය. අදාළ ක්‍රියාකාරකමට සුදුසු නිර්ණායක මත සිසුන් ඇගයීමට ලක් කළ යුතු ය. සිසුන්ගේ දක්ෂතා හඳුනාගෙන ඒවාට අවශ්‍ය උපස්ථම්භන ලබාදීමත් සුදුසු ප්‍රතිපෝෂණ ලබාදීමත් සිදුවිය යුතු ය.

සිසුන්ට ඉදිරිපත් කරනු ලබන සෑම ක්‍රියාකාරකමකදීම තක්සේරුකරණය හා ඇගයීම සිදුකිරීමට අවස්ථා තිබේ. සිසුන් කණ්ඩායම් වශයෙන් ගවේෂණයේ යෙදෙන අවස්ථාව තක්සේරුකරණයටත් කණ්ඩායම් අනාවරණ ඉදිරිපත් කෙරෙන හා අදහස් විස්තාරණය කෙරෙන අවස්ථා ඇගයීමටත් යොදා ගත හැකි වේ.

සිසුන් අදාළ කාර්යයේ යෙදෙන අවස්ථාවල දී ඔවුන් සමීපව නිරීක්ෂණය කරමින් ඔවුන්ගේ හැකියා, නොහැකියා, ශක්තීන් හා දුර්වලතා හඳුනාගනිමින් පන්තියේ සෑම ශිෂ්‍යයෙකුම අවම ප්‍රවණතා මට්ටමට ගෙන ඒමට ගුරුවරයා ක්‍රියා කළ යුතු වේ. මේ ක්‍රියාවලිය තක්සේරුකරණය නම් වේ. එසේම සිසුන් ස්වකීය අනාවරණ ඉදිරිපත් කරන හා අදහස් විස්තාරණය කරන අවස්ථාවලදී ඔවුන් ලඟාකරගත් ප්‍රවීණතා මට්ටම් විනිශ්චය කරමින් හා ප්‍රතිඵල සන්නිවේදනය කරමින් ඇගයීම් ක්‍රියාත්මක කළ හැකි වේ.

සිසු කණ්ඩායම් සමස්ත පන්තිය වෙත සාමූහිකව ඉදිරිපත් කරන අදහස්, ඇගයීම සඳහා යොදාගත හැකි පළමු අංශය බව මේ අනුව පැහැදිළි වේ. එම අදහස් නිවැරදි කිරීමට, වැඩි දියුණු කිරීමට හා විස්තාරණය කිරීමට කරණු ලබන ප්‍රයත්න ඇගයීම සඳහා පාදක වන දෙවන අංගය වේ.

සෑම ක්‍රියාකාරකමක් අවසානයේ දී ම හඳුන්වාදෙනු ලබන නිර්ණායක සහ තක්සේරුකරණයට හා ඇගයීමට යොදාගත හැකි වේ. මින් පළමු නිර්ණායක තුන දැනුම, ආකල්ප හා කුසලතා ඇගයීමට වෙන් වී ඇති අතර අනෙකුත් නිර්ණායක දෙක යහපත් ජීවන පුරුදු සිසුන් තුළ වර්ධනය කිරීමේ අරමුණින් හඳුන්වා දී තිබේ.

වර්ෂය තුළ නිම කළ යුතු පාසල් පාදක ඇගයීම් වාර ගණන නවයකි. සිසුන් ඉගෙනුමෙහි යෙදෙන අතරතුර කෙරෙන ඇගයීමට අමතරව තෝරාගත් ලක්ෂණයන් හයකදී මෙම ඇගයීම් ක්‍රියාත්මක කිරීම වඩා ඵලදායි වේ. ඒ ඒ ලක්ෂ්‍යය සඳහා ගැළපෙන ඇගයීම් උපකරණ කල් තබා සකස් කර ගෙන තිබීම මෙහිදී වැදගත් වේ.

ප්‍රවීණතාව ලබාගැනීම මට්ටම් කිහිපයක් ඔස්සේ සිදුවන බැවින් විෂයයක ප්‍රවීණතාව තහවුරු කිරීමට අවම වශයෙන් ලකුණු 60 ක් ඉක්මවා ලකුණු ලබා ගැනීම අවශ්‍ය වේ. ලකුණු 60-80 දක්වා සීමාව ආසන්න ප්‍රවීණතා මට්ටම ලෙසත් ලකුණු 60 ට අඩු සීමාව ප්‍රවීණතාව නැති මට්ටම ලෙසත් සලකනු ලැබේ. මේ කරුණු පහත සඳහන් ආකාරයෙන් වගු ගත කළ හැකි වේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඒ අනුව,

| | | | | | |
|---|---|---|---|---|---|
| ලකුණු | 0 | - | 60 | - | ප්‍රවීණතාව නැත |
| ලකුණු | 61 | - | 80 | - | ආසන්න ප්‍රවීණතාව |
| ලකුණු | 81 | - | 100 | - | ප්‍රවීණතාව |

ලෙස සැලකිය යුතු ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

<u>10 ශ්‍රේණිය - චිත්‍ර කලාව - විෂය නිර්දේශය - 2007</u>

| නිපුණතා හා නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|
| 01. පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.<br><br>1.1 මිනිසා, සතුන්, පරිසරය, සම්බන්ධ වූ පෘථුල තේමා යටතේ මනා සංරචනයකින් යුතු චිත්‍ර නිර්මාණය කරයි.<br><br>1.2 සම්ප්‍රදායික කලා ලක්ෂණ හඳුනාගෙන චිත්‍ර නිර්මාණය කරයි. | • පරිමාණය<br>• පර්යාලෝකය<br>• ගැඹුර<br>• සමබරතාව<br>• තේමාවේ අර්ථවත් බව<br>• සංරචනය<br>• විවිධ පරිසර ස්වභාවයන් හඳුනාගැනීම<br>• මිනිසුන් හා සතුන්ගේ පරිසරය හා බැඳුන ක්‍රියාකාරකම්<br><br>• සාම්ප්‍රදායික චිත්‍රවල මූලිකාංග හඳුනාගැනීම<br>• මූලධර්ම<br>• කලා ලක්ෂණ | 24 |
| 02. පරිසරයේ පවත්නා ද්‍රව්‍යයන් සම්පිණ්ඩනාත්මකව චිත්‍රණය කරයි.<br><br>2.1 ස්වභාවික හා නිර්මිත වස්තූන් සම්පිණ්ඩනය කර ස්වභාවික ලක්ෂණ මතුවන සේ ඇඳ වර්ණ ගන්වයි. | • පරිමාණය<br>• පර්යාලෝකය<br>• ත්‍රිමාණ බව<br>• ගති ලක්ෂණ<br>• රේඛා | 20 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| | • වර්ණ<br>• ස්වභාවික වස්තු හඳුනාගැනීම<br>• නිර්මිත වස්තු හඳුනාගැනීම | |
| 03.පාරිභාරික අවශ්‍යතා සඳහා යෝග්‍ය සැලසුම් හා සැරසිලි නිර්මාණ කරයි.<br><br>3.1 පාරිභාරික භාණ්ඩ සඳහා නිර්මාණාත්මක සැලසුම් ඇඳ සැරසිලි කරයි<br><br>3.2 ළමුන් භාවිතා කරන භාණ්ඩ හා රෙදිපිළි සඳහා සැලසුම් හා සැරසිලි නිර්මාණය කරයි. | • පාරිභාරික භාණ්ඩ<br>• මූලික සැලසුම්<br>• අවස්ථාවට උචිත බව<br>• භාවිතයට පහසු බව<br>• ළමා අවශ්‍යතාවන්ට උචිත බව<br>• සැරසිලි<br>• ගැලපීම<br>• වර්ණ<br>• නිර්මාණාත්මකබව<br>• නිමාව | 15 |
| 04. නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය කරයි.<br>4.1 සන්නිදර්ශන චිත්‍ර නිර්මාණය කරයි. | විවිධ සනිනිදර්ශන චිත්‍ර<br>• අවශ්‍යතාව<br>• සිද්ධාන්ත හා මූලිකාංග<br>• රේඛා<br>• හැඩතල<br>• වර්ණ<br>• නිදර්ශනාත්මකබව<br>• ගැලපීම<br>• නිර්මාණාත්මකබව | 06 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| 05. විවිධ මාධ්‍ය භාවිතයෙන් මූර්ති හා කැටයම් නිර්මාණය කරයි.<br><br>5.1 විවිධ හැඩතල උපයෝගිකර ගනිමින් උන්නත කැටයම් නිර්මාණය කරයි. | • විවිධ මාධ්‍ය භාවිතය<br>• නෙලීමේ ශිල්ප ක්‍රමය<br>• ඇඹීමේ ශිල්ප ක්‍රමය<br><br>සිද්ධාන්ත හා මූලිකාංග<br>• නිර්මාණාත්මක බව<br>• මාධ්‍යයට උචිත බව<br>• නිමාව | 06 |
| 06. ආගමික හා සංස්කෘතික අංග,දෙස් විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජන මාධ්‍යය ඇසුරින් හඳුනාගත් කලා අංග පිළිබඳ අධ්‍යයනය කරයි.<br><br>6.1 තෝරාගත් දේශීය හා විදේශීය ශිල්පීන්ගේ කලා කෘති අගයයි. | ➢ එම්.සාර්ලිස්<br>• බෞද්ධ චිත්‍ර (ලිතෝචිත්‍ර)<br>➢ සෝලියස් මෙන්ඩිස්<br>• නව කැළණි විහාරයේ චිත්‍ර<br>➢ එච්.ඒ.කරුණාරත්න<br>• තෙල් සායම් චිත්‍ර<br><br>➢ ජෝර්ජ් කීට්<br>• ගෝතමී විහාරයේ චිත්‍ර<br>• නායිකා චිත්‍ර | 08 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| 6.2 ජනමාධ්‍ය ආශ්‍රිත විවිධ නිර්මාණාත්මක කලා අංග අගයයි. | ➢ ලියනාඩෝ ඩාවින්චි<br>• පර්වත මස්තකයේ දේව මෑණියෝ<br>• මරියතුමිය සහ කානේෂන් මල<br>• අවසන් භෝජන සංග්‍රහය<br>➢ මයිකල් ආන්ජිලෝ<br>• ආදම් මැවීම<br>• අවසන් විනිශ්චය<br>• ඩේවිඩ් ප්‍රතිමාව<br>• පියෙටා ප්‍රතිමාව<br>➢ රෆායල් සෙන්සියෝ<br>• ඇතැන්ස් ගුරු කුලය<br>• මරිය මව්තුමිය සිංහාසනාරූඪ කරවීම<br>• ළදරු ශාන්ත ජෝන් , ජේසු බිළිඳා හා මරිය මව්තුමිය<br><br>තෝරාගත් ළමා ටෙලි නාට්‍ය<br>• අංග රචනය<br>• රංග වස්ත්‍රාභරණ<br>• පසුතල නිර්මාණය<br>• ආලෝකකරණය | |
| 07. දේශීය හා විදේශීය ඓතිහාසික චිත්‍ර , මූර්ති හා ගෘහ නිර්මාණ කලාවන්ගේ ගුණාත්මකතාවන් විමර්ශනය කර ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.<br><br>7.1 මහනුවර සහ ගම්පල | ➢ මහනුවර යුගයේ කලා | 10 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| යුගවල ගෘහ නිර්මාණ , චිත්‍ර හා මූර්ති කලාව පිළිබඳ ගවේශණය කරයි. | නිර්මාණ හා ගෘහ නිර්මාණ<br>ගෘහ නිර්මාණ<br>• දළදා මාලිගය<br>• මැදවල ටැම්පිට විහාරය<br>චිත්‍ර<br>▪ දඹුල්ල විහාරයේ චිත්‍ර<br>▪ දෙගල්දොරුව විහාරයේ චිත්‍ර<br>මූර්ති<br>▪ දඹුල්ල විහාරයේ හිඳි පිළිම<br>➢ ගම්පල යුගයේ කලා නිර්මාණ හා ගෘහ නිර්මාණ<br>ගෘහ නිර්මාණ<br>▪ ගඩලාදෙනිය විහාරය<br>▪ ලංකාතිලක විහාරය<br>චිත්‍ර<br>▪ ලංකාතිලක විහාරයේ චිත්‍ර<br>මූර්ති<br>▪ ගඩලාදෙනිය විහාරයේ බුද්ධ ප්‍රතිමාව. | |
| 7.2 මිසර හා ග්‍රීක කලාවන් පිළිබඳ ගවේශණය කරයි. | ➢ මිසර කලා නිර්මාණ<br>මූර්ති<br>▪ නෙපර්ටිටි<br>▪ ලියන්නා<br>▪ ස්පිනික්ස් | |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| | චිත්‍ර<br>▪ මිඩම්හි පාත්තයෝ<br>▪ කුරුළු දඩයම<br><br>➢ ග්‍රීක කලා නිර්මාණ<br>▪ වීනස් දී මේලෝ<br>▪ කවපෙත්ත විසිකරන්නා<br>▪ ඩයොනිසස් හා හර්මීස්<br>▪ ඇතීනා දෙවඟන<br>▪ ලැඹකුන් | |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.